# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1951/12 - 2016 ජනවාරි මස 26 වැනි අඟහරුවාදා - 2016.01.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට යාපනය - ප්‍රජාමූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ ඩෙල්ෆ්ට් වැඩබිම් කාර්යාලය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 ජනවාරි මස 18 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1167

### උපලේඛනය

යාපනය දිස්ත්‍රික්කයේ, ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක J/05, ඩෙල්ෆ්ට් මධ්‍යම නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ, ඩෙල්ෆ්ට් ගමේ පිහිටි පිදරි කෝවිල් වලව් නොහොත් පිදරිමුනෙයි නැමති ඉඩමෙන් හෙක්ටයාර් 0.1028 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | වෙරළ රක්ෂිතය ; |
| *නැගෙනහිරට* | : | අම්බලවන්නාර් ශන්මුගරත්නම් හිමිකම් කියන ඉඩම ; |
| *දකුණට* | : | කන්දයියාගේ බිරිඳ වන කට්පහම් හා තවත් අය හිමිකම් කියන ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | කන්දයියාගේ බිරිඳ වන කට්පහම් හා තවත් අය හිමිකම් කියන ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් :*

01. ඉරප්පියල් සෙබමාලෙයි
කොට්ඨාස අංක 11, ඩෙල්ෆ්ට්.

02. ජොබිනම්මා සෙබමාලෙයි
කොට්ඨාස අංක 11, ඩෙල්ෆ්ට්.

02 - 296

1A - G 22927 — 16 (2016/01)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

### 92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට පිටකෝට්ටේ ජුබිලි ජලාශ ඉඩමේ නව ජල තටාකය ඉදිකිරීම සඳහා ප්‍රවේශ මාර්ගය සහිත ඉඩම් කොටස අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 ජනවාරි මස 18 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1160

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 522බී, පිටකෝට්ටේ ග්‍රාම නිළධාරි වසමේ, පිටකෝට්ටේ ගමේ පිහිටි කුරුඳුවත්ත පාර නොහොත් රජමහ විහාර පාර නැමති කො. 5273 මූලික පිඹුරේ කැබලි අංක 7 ලෙස දැක්වෙන සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 40 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මු. පි. කො. 5273 හි කැබලි අංක 01 ; |
| *නැගෙනහිරට* | : | කොස්ගහවත්ත ; |
| *දකුණට* | : | මු. පි. කො. 5273 කැබලි අංක 06 ; |
| *බටහිරට* | : | හික්ගහවත්ත. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : නගර සභාව
මහරගම.

02 - 297

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.